---

**කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 25 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). රු.401,835 ක්වූ ස්ථාවර වත්කම් විෂයයන් 12 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර තවත් වත්කම් විෂයයන් 05 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු බවට නිශ්චය කරන ලද විෂයයන් 06 කට අදාල ආදායම් රු.560,716 ක් වැඩියෙන්ද, විෂයයන් 05 කට අදාල ආදායම රු.175,127 ක් අඩුවෙන්ද, මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවිය යුතු උසාවි දඩ ආදායම හා මුද්දර ගාස්තු ආදායම නිශ්චය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශුද්ධ වත්කම් වල එකතුව හා සමුච්චිත අරමුදල ඇතුළු වගකීම්වල එකතුව අතර රු.1,827,017 ක වෙනසක් දැක්වුණි.

**1.3.2 නොසැසඳු ගිණුම්**

(අ). ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන්ගේ එකතුව හා උපයෝගී ලේඛන අනුව ශේෂයන්ගේ එකතුව අතර රු.573,153 ක වෙනසක් දැක්වුණි.

(ආ). ප්‍රාදේශීය සභා සඳහා පිළිගත් ගිණුම් ක්‍රමය අනුව ස්ථාවර වත්කම් ගිණුම්වල ශේෂයන්හි එකතුව හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය එකිනෙකට සමාන විය යුතු වුවත් එම ගිණුම් දෙක අතර රු.6,559,706 ක වෙනසක් දැක්වුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 247,748 ක්වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.632,635 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.207,222 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති අංක 180 ප්‍රකාරව මුදල් හෝ ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන් හෝ ආදායම් පිළිබඳ රාජකාරි ඉටු කරන නිලධාරීන් විසින් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි.

(ආ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 237 ප්‍රකාරව ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී අදාල භාණ්ඩ ගිවිසුම් ප්‍රකාරව ගුණාත්මකව ගබඩාවට ලැබුණු බවට සහතිකයක් ලබාගත යුතු වුවත් එම අවශ්‍යතාවයෙන් බැහැර වී අවස්ථා 17 කදී එකතුව රු.112,689 ක් ගෙවා තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | වරිපනම් බදු | 100 | 260 | 160 |
| (ii). | බදු කුලී | 1,835 | 1,327 | 597 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 289 | 382 | 93 |
| (iv). | වෙනත් ආදායම් | 1,834 | 527 | 1,423 |

### 2.3.2 වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) හා 153 (1) වගන්ති අනුව දේපල වල වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු පැනවීම හා සංවර්ධනය නොකළ ඉඩම් මත බද්දක් පනවා අයකර ගැනීමට සභාවේ අවධානය යොමු කර නොතිබුණි.

### 2.3.3 කඩ බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව සභාව සතුව තිබුණු කඩ කාමර 05 කින් පසුගිය වර්ෂ 03 කට අදාලව හිඟව ඇති රු.80,102 ක මුදලක් අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

### 2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ හා මුද්දර ගාස්තු ප්‍රමාණය නිශ්චය කර ගිණුම්ගත කර නොතිබුණි.

### 2.3.5 වෙනත් ආදායම්

පළාත් පාලන කොමසාරිස්ගේ 1989 සැප්තැම්බර් 30 දිනැති අංක එල්ජී/3 දරන චක්‍රලේඛයේ viii ඡේදය ප්‍රකාරව බදු දේපලවල අවම ලංසුවවත් අය නොකිරීම නිසා සභාවට රු.349,200 ක පාඩුවක් සිදුව තිබුණි

## 2.4 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

සභාව සතු වටිනාකම වූ රු.1,170,000 ක්වූ ට්‍රැක්ටර් 02 ක් වසර 03 ක පමණ කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රියව පැවතුනි.

## 2.5 කොන්ත්‍රාත් පරිපාලනය

පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන සහතික ලබා ගැනීමෙන් තොරව කර්මාන්ත 05 ක් සඳහා එකතුව රු.3,608,558 ක් ගෙවීම් කර තිබුණු අතර තත්ත්ව පාලන වාර්තා අනුව ප්‍රමිතීන්ට අනුකූල නොවන බවට වාර්තා කර තිබියදීත් එක් කර්මාන්තයක් වෙනුවෙන් රු.441,720 ක් ගෙවා තිබුණි.

## 2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ඉදිරි වර්ෂවල ක්‍රියාකාරිත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 13 දෙනෙකු සේවයේ යොදවා ගෙන වැටුප් හා දීමනා වශයෙන් රු.1,083,935 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

## 2.7 සනඅපද්‍රව්‍ය කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් පරිසර හිතකාමී කසල කළමනාකරණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). වත්කම් කළමනාකරණය

(ඈ). කොන්ත්‍රාත් පරිපාලනය